# වාර්ෂික වාර්තාව
# Annual Report
# 2013

## ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම
තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

## Sri Lanka Inventors Commission
**Ministry of Technology & Research**

---

ලන්ලිබ් ගොඩනැගිල්ල, අංක 46/56, නවම් මාවත, කොළඹ 02.
**LANLIB Building, No.46/56, Nawam Mawatha, Colombo 02**

# වාර්ෂික වාර්තාව - 2013

**ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම**

**ලන්ලිබ් ගොඩනැගිල්ල, අංක 46/56,**
**නවම් මාවත,**
**කොළඹ 02.**

# **කොමිසමේ සාමාජිකයින්**

දීපාල් සූරියආරච්චි මයා

**කොමසාරිස්**

ආචාර්ය ගමික ප්‍රතාපසිංහ මයා

**සහකාර කොමසාරිස්**

නලින් ඩී. කරුණාසිංහ මයා

**සහකාර කොමසාරිස්**

පී.එම්. සුදර්ශනි පීරිස් මිය

**භාණ්ඩාගාර නියෝජිත**

ඩී. අනුරාධා එල්. ඉලේපෙරුම මිය

**අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)**

# පටුන

**මාතෘකාව** **පිටුව**


**1. කොමසාරිස්තුමාගේ පණිවිඩය** 01

**2. ස්තුතිය** 02

**3. හැඳින්වීම**
කොමිසමේ දර්ශනය 03
මෙහෙවර ප්‍රකාශනය 03
කොමිසමේ අරමුණු 03
කොමිසමේ කාර්යභාරය 04
නව නිපැයුම් කොමිසම අරමුණු කොට ඇති ප්‍රධාන ක්‍රමෝපායන් 05

**4. කාර්යය සාධනය**
පසුබිම 06

**5. ප්‍රධාන ක්‍රමෝපායයන් - ජනප්‍රියත්වය හා දැනුම ලබාදීම හරහා නව නිපැයුම්වල තත්ත්වය වැඩිදියුණු කිරීම**

වැඩසටහන 01 - පාසැල් නව නිපැයුම් සමාජ සහ පළාත් නව නිපැයුම් ප්‍රදර්ශන 07-09
වැඩසටහන 02 - Young Inventors Club - විද්‍යුත් මාධ්‍ය වැඩසටහන 09-11

**6. ප්‍රධාන ක්‍රමෝපායයන් - පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට අන්තර්ගත කිරීම හරහා නිපැයුම් හා නව නිපැයුම්කරුවන් පිළිබඳව ඇති ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම හා බලගැන්වීම**

වැඩසටහන 03 - නව නිපැයුම්කරුවන්ගේ සමුළුව 12
වැඩසටහන 04 - ජිනීවා ජාත්‍යන්තර නව නිපැයුම් තරගයට සහභාගී වීම 12
වැඩසටහන 05 - "සහසක් නිමැවුම්" ජාතික නව නිර්මාණ ප්‍රදර්ශනය 13-15
වැඩසටහන 06 -ජනාධිපති සම්මාන 16-18
වැඩසටහන 07 - නව නිපැයුම්කරුවන් සඳහා වූ ජාතික සම්මන්ත්‍රණය 19

**7. ප්‍රධාන ක්‍රමෝපායයන් - ප්‍රධාන තාක්ෂණ වෙළඳපොළට ප්‍රවිෂ්ට වීම**

වැඩසටහන 08 - ව්‍යාපාරික හමුව 20
වැඩසටහන 09 - වෙබ් අඩවිය 20
වැඩසටහන 10 - නව නිපැයුම්කරුවන්ගේ අරමුදල 21

**8. ප්‍රධාන ක්‍රමෝපායයන් - මානව සම්පත් සංවර්ධනය** 22-24

**9. මාධ්‍ය ප්‍රචාරණය** 25

**10. නව නිපැයුම්කරුවන්ගේකොමිසමට අදාල පනත** 25

**11. අයවැය සහ අනෙකුත් යෝජනා** 25

**12. විගණන වාර්තාව**

## 1. කොමසාරිස්තුමාගේ පණිවිඩය

2013 වසර අර්ථ දැක්වීමේදී සුවිශේෂී කාර්ය භාරයන්හි නියැලෙන කාර්යශූර කණ්ඩායමක් ලෙස වසර පුරා පැමිණි බාධාවන් හා අපහසුතාවයන් මගහරවා ගනිමින් ඉහළ සාර්ථකත්වයක් කරා ලඟා වීමට අපට හැකි වූ බව කිව යුතු ය.

2013 සිට 2015 දක්වා වූ තුන් අවරුදු ක්‍රමෝපාංග සංවර්ධන සැලැස්ම මත පදනම්ව මෙලෙස ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් අතුරින් ප්‍රමුඛ ස්ථානයේ ලා ගැනෙන Young Inventors Club වැඩසටහන පාසල් නිර්මාණකරුවන් සඳහාම වෙන් වූ ප්‍රථම විද්‍යුත් මාධ්‍ය වැඩසටහන වශයෙන් හඳුන්වා දිය හැකිය. ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශය වූ මෙම වැඩසටහනට 2013 වසරේ දී රයිගම් ටෙලි සම්මාන උළෙලේ දී වසරේ හොඳම ප්‍රශ්නවිචාරාත්මක වැඩසටහන වශයෙන් සම්මානයට පාත්‍ර වීම එහි සුවිශේෂීත්වය ප්‍රකට කරවන සිදුවීමකි.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සියලුම ක්‍රියාකාරකම් ප්‍රධාන ක්‍රමෝපායන් පහකට අනුව ව්‍යුහගත කර තිබේ. සීමිත මානව හා මූල්‍ය පහසුකම්සම්පත් මධ්‍යයේ වුව ද කොමිසම සැලකිය යුතු අන්දමේ සාර්ථක ප්‍රගතියක් අත්කරගෙන ඇත.

නව නිපැයුම් සඳහා ඉහළ වටිනාකමක් ඇතිකරමින් ජාතික න්‍යාය පත්‍රය තුළ ප්‍රමුඛතාවයක් ලබා ගැනීම සහ නව නිපැයුම් නිර්මාණය කිරීම සඳහා යහපත් පරිසරයක් නිර්මාණය කිරීම කොමිසම තම වගකීම් ලෙස විශ්වාස කරනු ලබයි. අනාගතයේදී රටේ ආර්ථිකය නව නිපැයුම් බිහිකිරීමේ හැකියාව මත පදනම් විය යුතු ය. නව නිපැයුම් මූලික කරගත් ආර්ථික සමාජයක් ගොඩනැගීම සඳහා නව නිපැයුම්වල ගුණාත්මක බව, නව නිපැයුම් සඳහා ව්‍යවසායකත්වය, ආයෝජක ප්‍රජාවගේ සහයෝගය සහ ප්‍රතිපත්ති සම්පාදන රාමු යන මූලිකාංග අත්‍යාවශ්‍ය වේ. අපේ සියලුම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම අරමුණ වෙනුවෙන් වේ.

මෙම වසරේදී අපට අත්විඳින්නට සිදුවූ අවාසනාවන්තම සිදුවීම වූයේ, සහසක් නිමැවුම් ප්‍රදර්ශනය ආරම්භයේදී 200 කට ආසන්න නව නිර්මාණයන් දවමින් හටගත් ගින්නයි. මෙම අනපේක්ෂිත සිදුවීමහමුවේ ධෛර්යසම්පන්නව කටයුතු කිරීමට, අප අමාත්‍යතුමන් වෙතින් ලද මගපෙන්වීම, සහයෝගය හා දිරියස්තුති පූර්වකව අගය කරමි. අධෛර්යමත් හා පසුබෑමට පත් නිර්මාණකරුවන් ධෛර්යමත් කරමින් නගාසිටුවීම සඳහා අප විසින් 'ෆීනික්ස්' නමින් කඩිනම් ව්‍යාපෘතියක් දියත් කළෙමු.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ක්‍රියාවට නැංවූ SIIP (Solutions, Inventions, Ideas and Products)වැඩසටහනහේතුවෙන් නව නිපැයුම් ඉදිරිපත් කළ විශ්ව විද්‍යාල සිසුන් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් දැකගත හැකිවිය.

2012 සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනයේ දසිස් සම්මාන ලත් නව නිපැයුම්කරු ජිනීවා අන්තර්ජාතික නව නිපැයුම් තරගයේ දී රන් හා රිදී සම්මානයෙන් පිදුම් ලැබ ජාත්‍යන්තරය ජය ගැනීම ශ්‍රී ලාංකික අපට සැබවින්ම ආඩම්බරයකි. එමෙන්ම 2011 වසර දක්වා නිර්දේශිත සෑම නිර්මාණකරුවෙක්ම මෙම අභිමානවත් ප්‍රදර්ශනයේදී සම්මානයට පාත්‍ර වී ඇත.

කිහිපදෙනෙක් හැරුණුකොට බොහෝ නව නිපැයුම්කරුවන් වාණිජමය ලෙස සාර්ථක වී ඇති බැව් පෙනේ. එමෙන්ම ඔවුන්ගේ ගමන් මග පිළිබඳව අපි නිරතුරුවම අවදියෙන් සිටින්නෙමු.

නව නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන සපයන නව නිපැයුම්කරුවන්ගේ අරමුදල වසර කිහිපයක් අක්‍රියව පැවති නමුත් මෙම වසරේදී තියුණු හා විනිවිද භාවයකින් යුත් ක්‍රමවේදයක් යටතේ සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු යොදා ඇත. නව නිපැයුම් වාණිජ තලයට රැගෙන යාම මෙහි පරමාර්ථය බව අවධාරණය කරමි.

## 2. ස්තුතිය

කොමිසමෙහි වැඩකටයුතුවලට මෙන්ම, තම වටිනා කාලය හා අවකාශය සපයමින් නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමෙහි ලා අගනා පිටිවහලක් මාධ්‍යය වෙතින් ලැබිණි.

අමාත්‍යාංශ ලේකම්ඇතුළු නිලධාරීන්ගෙන් ද, අමාත්‍යාංශයට අදාළ වෙනත් ආයතන වලින් ද නොමසුරු සහයෝගයක් අප වෙත සෑම අවස්ථාවකදීම ලැබිණි.

නිරන්තරයෙන් කැපවී, ඉතා යුහුසුළුව කටයුතු කරන මාගේ කණ්ඩායමට, මම හද පිරි ස්තුතිය පුද කරමි. පුද්ගලික අංශය නියෝජනය කළ මා හට මෙවැනි කණ්ඩායමක් මෙහෙයවීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

අනුරාධා ඉලේපෙරුම මහත්මිය වසර 3ක් මුළුල්ලේ අධ්‍යක්ෂක ධූරය දරමින් කොමිසමෙහි ඉලක්ක සපුරාගැනීමෙහි ලා අනගි මෙහෙවරක් ඉටු කළාය. ඇය උද්‍යෝගවත් හා වෘත්තීයමය නිපුණතාවය ප්‍රකට කල තැනැත්තියක බව කිව යුතුය.

මාගේ හිතවත් සහකාර කොමසාරිස්වරුන් තම කාලයෙන්, දැනුමෙන් හා නව නිපැයුම්කරුවන් පිළිබඳ ව ඇති දැක්මෙන් දුන් සහයෝගය අති විශාලය. භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස මෙම වසර මුල්භාගයේ අප හා සම්බන්ධ වූ මාලිකා සමරවීර මහත්මිය අප කොමිසමේ දැක්ම සාක්ශාත් කරගැනීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කල බව ද ස්තුති පූර්වකව සඳහන් කරමි.

## 3. හැඳින්වීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත මගින් ස්ථාපිත කර ඇති ඒකමරාජ්‍ය ආයතනය වන අතර,මහා භාණ්ඩාරය විසින් ලබා දී ඇති සීමිත ප්‍රතිපාදන ද සීමිත කාර්ය මණ්ඩලය ද උපයෝගී කරගනිමින් 2013 වසරේදී සතුටුදායක මට්ටමින්සුවිශේෂී කාර්යයන් ඉටුකර ඇත.

## දර්ශනය

අද්විතීය ශ්‍රී ලාංකිකපුරවැසියන්ගේ නව නිපැයුම් තාක්ෂණයන් ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කොට ජාතියේ උන්නතිය මෙන්ම ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා එහි උපරිම ප්‍රතිලාභ උපයෝගී කොට ගැනීම.

## මෙහෙවර

තාක්ෂණික, මුල්‍යමය හා නීතිමය සහය ලබා දීම තුලින් ශ්‍රී ලාංකීය ජනතාව අතර නව නිපැයුම් ප්‍රවර්ධනය දිරිගැන්වීම.

## කොමිසමේ අරමුණු

1. නවෝත්පාදන හිතකාමී  පරිසරයක් නිර්මාණය කිරීම.

2. නව නිපැයුම් කෙරෙහි යොමු වූ විවිධ කාණ්ඩවලට අයත් පිරිස් සඳහා දැනුම ලබා දීම.

3. ජාතියට උපරිම ප්‍රතිලාභ සැලසිය හැකිවන පරිදි ජාතික වැදගත්කමකින් යුත් නව නිපැයුම් වාණිජ වශයෙන් නිෂ්පාදනය කිරිම සඳහා සහාය ලබා දිම.

4. ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ හා ස්වකිය නිෂ්පාදන  වල උපරිම දායකත්වය ලබාදීම.

5. ස්වකීය නව නිපැයුම් ජාත්‍යන්තර වෙළඳ පොළ වෙත  හඳුන්වාදීම.

6. නව නිපැයුම් කරුවන්ගේ බුද්ධිමය දේපල අයිතීන් සුරැකීම.

## කොමිසමේ කාර්යභාරය

1. පේටන්ට් බලපත්‍ර ලබා දීමට සුදුසු නව නිපැයුම් තෝරා පේටන්ට් බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

2. පේටන්ට් බලපත්‍ර ලබා ගන්නා ලද නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීම හා නිෂ්පාදන භාණ්ඩ බවට පත් කිරීම සඳහා මූල්‍යමය ආධාර ලබාදීම.

3. ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ බුද්ධිමය දේපල අයිතීන් උල්ලංඝණය වන විටකදී ඔවුන්ගේ බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා නීතිමය සහාය ලබාදීම.

4. පේටන්ට් බලපත්‍රය ඇපයට තබාගෙන රාජ්‍ය හෝ වෙනත් ආයතන වලින් ණය ලබාදීමට හැකිවන පරිදි වාණිජමය වටිනාකමකින් යුත් නව නිපැයුම් නිර්දේශ කිරීම.

5. දේශීය හා විදේශීය වෙළඳ පොළ පහසුකම් සොයා ගැනීමට උපකාර කිරීම.

6. පේටන්ට් බලපත්‍රලාභී නව නිපැයුම්කරුවන්ගේ නව නිර්මාණ ඇගයීම සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීම.

7. නව නිපැයුම් සඳහා පර්යේෂණ සිදුකිරීමට හැකිවන පරිදි සැමට විවෘත පර්යේෂණාගාරයක් ආරම්භ කිරීම.

8. නව නිපැයුම් පුවත් සඟරාව මුද්‍රණය කිරීම හා රූපවාහිනී ගුවන්විදුලි වැඩසටහන් සංවිධානය කිරීම ඇතුළුඅනෙකුත් මාධ්‍ය වැඩසටහන් මගින් නව නිපැයුම්කරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

9. පාසල්,කාර්මික විද්‍යාල හා විශ්ව විද්‍යාල මෙන්ම පොදු ජනතාව සඳහා නව නිපැයුම් කව පිහිටුවීම තුලින් තරුණ කොටස් අතර නව නිපයුම්කරණය ප්‍රචලිත කිරිම.

10. නව නිපැයුම් වාණිජකරණය කිරීම.

## නව නිපැයුම් කොමිසම අරමුණු කොට ඇති ප්‍රධාන ක්‍රමෝපායන්

ක්‍රමෝපාය සැලැස්මේ ප්‍රධාන අංග පහ යටතේ කොමිසමේ කාර්යභාරය ගොනු කර ඇත.

| ප්‍රධාන ක්‍රමෝපායයන් | ජාතික මට්ටමින් ලබා ඇති ප්‍රගතිය | සාර්ථකත්වය | | |
|---|---|---|---|---|
| | | 2011 | 2012 | 2013 |
| **ජනප්‍රියත්වය හා දැනුම ලබාදීම හරහා නව නිපැයුම්වල තත්ත්වය වැඩිදියුණු කිරිම** | ජයග්‍රහණ ලබා ඇති ජාතික /ජනාධිපති සම්මාන සංඛ්‍යාව.<br><br>ජයග්‍රහණ ලබා ඇති ජාත්‍යන්තර සම්මාන සංඛ්‍යාව.<br><br>වාණිජකරණ වූ සහ වටිනාකම් තක්සේරු කරන ලද නවෝත්පාදන සංඛ්‍යාව. | 08<br><br>-<br><br>20 (2011 සිට ඉහළට) | 261<br><br>02<br><br>දත්තයන් ප්‍රමාණවත් නොමැත | 72<br><br>02<br><br>දත්තයන් ප්‍රමාණවත්නොමැත |
| **ප්‍රධාන තාක්ෂණ වෙළඳපොළට ප්‍රවිෂ්ඨ වීම** | වාණිජකරණය වූ සහ වටිනාකම් තක්සේරු කරන ලද නවෝත්පාදන සංඛ්‍යාව.<br><br>ඒන්ජල් නෙට්වර්ක් ආයතනය විසින් අනුග්‍රහය දක්වන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව. | 20<br><br>- | දත්තයන් ප්‍රමාණවත් නොමැත<br><br>- | දත්තයන් ප්‍රමාණවත්නොමැත<br><br>ලංකා ඒන්ජල් නෙට්වර්ක් ආයතනය සහසක් නිමැවුම්හි ජයග්‍රාහකයන් සඳහා අනුග්‍රහය දැක්වීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී |
| **පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට අන්තර්ගත කිරීම හරහා නිපැයුම් හා නව නිපැයුම්කරුවන් පිළිබඳව ඇති ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම හා බලගැන්වීම** | අනෙකුත් පෞද්ගලික හා රාජ්‍ය ආයතන මඟින් මාධ්‍ය ප්‍රචාරණය හරහා නව නිපැයුම්කරුවන් සඳහා අනුග්‍රහය සැපයීම. | දත්තයන් ප්‍රමාණවත් නොමැත | සියලුම වර්ගයේ රූපවාහිණී නාලිකාවල | |
| **මූල්‍යමය පරායත්තතාවය අඩුවීම** | කොමිසම විසින් සංවිධානය කරන ලද විවිධ වැඩසටහන් සඳහා පෞද්ගලික ආයතන වල අනුග්‍රහය.<br><br>පෞද්ගලික ආයතන විසින් ලබාදුන් මූල්‍ය අනුග්‍රහයන් වල වටිනාකම්. | දත්තයන් ප්‍රමාණවත් නොමැත | මිලියන 09 | මිලියන 0.9<br><br>ලංකා ඒන්ජල් නෙට්වර්ක් ආයතනය සහසක් නිමැවුම්හි ජයග්‍රාහකයන් සඳහා අනුග්‍රහය දැක්වීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී |
| **මානව සම්පත් සංවර්ධනය** | පුහුණු වැඩසටහන් ගණනාවක් සංවිධානය කිරීම. | - | 06 | 11 |

# 4. කාර්යය සාධනය

## පසුබිම

2013 වර්ෂය වෙනුවෙන්ශ්‍රී ලං. න. නි. කොමිසමේ ප්‍රාග්ධන වියදම් සඳහා ජාතික අයවැයෙන් අනුමත මුදල රු.මි. 35 කි. ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර, භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීමට අනුමත මුදල රු.මි 34.72 ක් වුවද කොමිසම වෙත නිකුත් වූයේ රු.මි. 17 පමණි. මෙය කොමිසම විසින් 2013 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා අහිතකර ලෙස බලපාන ලදී.

| මාසය | පුනරාවර්තන | | ප්‍රාග්ධනය | |
|---|---|---|---|---|
| | නිර්දේශකරනල ද | නිකුත්කරනලද | නිර්දේශකරනලද | නිකුත්කරනලද |
| ජනවාරි | 950,000.00 | 950,000.00 | - | 0.00 |
| පෙබරවාරි | 1,100,000.00 | 1,100,000.00 | 710,000.00 | 0.00 |
| මාර්තු | 1,640,000.00 | 1,640,000.00 | 1,475,000.00 | 1,475,000.00 |
| අප්‍රේල් | 1,300,000.00 | 1,300,000.00 | 1,000,000.00 | 1,710,000.00 |
| මැයි | 420,000.00 | 420,000.00 | 1,026,000.00 | 1,026,000.00 |
| ජූනි | 900,000.00 | 900,000.00 | 1,100,000.00 | 0.00 |
| ජූලි | 1,850,000.00 | 1,250,000.00 | 5,015,000.00 | 500,000.00 |
| අගෝස්තු | 2,700,000.00 | 1,500,000.00 | 6,835,000.00 | 750,000.00 |
| සැප්තැම්බර් | 2,500,000.00 | 2,900,000.00 | 8,015,000.00 | 1,000,000.00 |
| ඔක්තෝබර් | 1,800,000.00 | 2,400,000.00 | 8,985,000.00 | 0.00 |
| නොවැම්බර් | 2,145,000.00 | 870,000.00 | 0.00 | 10,600,000.00 |
| දෙසැම්බර් | 1,814,000.00 | 1,300,000.00 | 563,100.00 | 0.00 |
| **එකතුව** | **19,119,000.00** | **16,530,000.00** | **34,724,100.00** | **17,061,000.00** |


අරමුදල් ලබාදීමේ ප්‍රගතිය - ප්‍රාග්ධනය වැයවීම
12000000
10000000
8000000
6000000
4000000
2000000
0
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
නිර්දේශ කරන ලද
නිකුත්කරන ලද

## 5. ප්‍රධාන ක්‍රමෝපායන් - ජනප්‍රියත්වය හා දැනුම ලබාදීම හරහා නව නිපැයුම්වල තත්වය වැඩිදියුණු කිරීම

### වැඩසටහන 01 - පාසල් නව නිපැයුම් සමාජ සහ පළාත් නව නිපැයුම් ප්‍රදර්ශන

**1. කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් සඳහා වැඩමුළු**

පාසැල් ළමුන්ගේ නිර්මාණශීලී හැකියාවන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය පුහුණු වහා මගපෙන්වීම ලබා දීමේ අරමුණින් පළාත් හා කලාප අධ්‍යක්ෂකවරුන් සඳහා වැඩමුළුවක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 ජනවාරි මස 29 වන දින ඉසුරුපායේ දී පවත්වන ලදී.

මෙහිදී කලාප මට්ටමින් නව නිපැයුම් ප්‍රදර්ශනපැවැත්වීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. 2013 මැයි මසට පෙර අදාල තරඟ පවත්වා, එම ප්‍රතිඵල කොමිසම වෙත යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

රටේ සියලුම කලාප හා පළාත් නියෝජනය කරමින් අධ්‍යක්ෂවරු 69 දෙනෙක් මෙම වැඩමුළුවට සහභාගී වූහ.

**11. පාසැල් නව නිපැයුම්කරුවන් ඇගයීම වෙනුවෙන් වූ වැඩමුළු**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2006/23 චක්‍ර ලේඛය අනුව 2 AB,1C සහ 2 වර්ගයේ පාසැල්වල නව නිපැයුම් සමාජ පිහිටුවීමට සලකා බලා තිබේ. පාසැල් හා කලාප මට්ටමින් නව නිපැයුම් ප්‍රදර්ශනපවත්වා පළාත් තරඟ සඳහා නව නිපැයුම් තෝරාගනු ලබයි.

මෙම ප්‍රදර්ශන පැවැත්වීමේදීමතුවන ගැටළුවක් වනුයේ නව නිපැයුම් අධීක්ෂණය සඳහා සුදුසුකම්ලත් ප්‍රවීනයන් සම්බන්ධ කර ගැනීමට අපහසු වීමයි.මෙයට විසඳුමක් වශයෙන් කොමිසම විසින් කලාප හා පළාත් මට්ටමේ නව නිර්මාණ තෝරා ගැනීම සඳහා විශේෂ පුහුණුවැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම පුහුණු වෘත්තිකයන් ලංකාව පුරා ඇති විශ්ව විද්‍යාල, කාර්මික තාක්ෂණ ආයතන, ක්‍රියාකාරී නව නිපැයුම් සමාජ සහිත පාසැල් වල අදාල විෂයභාර ගුරුවරුන් හා අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත විය. මෙම වැඩමුළුවේදී ඉංජිනේරු හා අධ්‍යාපන ක්ෂේත්‍ර මෙන්ම පාසල් නව නිර්මාණ කරණයේ ප්‍රවීණයන් ද සිය අත්දැකීම් ඔවුන් හා බෙදා ගන්නා ලදී.

වැඩමුළුව සඳහා සම්බන්ධ වූවන් හට නිර්මාණ ඇගයීම පිළිබඳ මාර්ගෝපදේශන පත්‍රිකා බැගින් ලබා දුන් අතර ලෝකයේ විවිධ රටවල පාසැල් මට්ටමේ නව නිර්මාණ පිළිබඳ අවබෝධයක් ලබාදීමට ද කටයුතු කරන ලදී. නිර්මාණය කරන ලද නව නිපැයුම් ප්‍රචාරණය සඳහා ඔවුන් සිදුකරන ක්‍රියාමාර්ග පිළිබඳව මෙහිදී දැනුවත් කිරීමක් සිදුකරන ලදී.

වැඩමුළුව තුළ පුහුණුව ලැබූ ප්‍රවීනයන් පළාත් හා කලාප තරඟ විනිශ්චය කිරීම සඳහා යොමු කිරීමට ද පියවර ගැනුණි. මෙලෙස විවිධ රාජ්‍ය ආයතනවලින් පැමිණ පුහුණුව ලැබූ ප්‍රවීනයන් සංඛ්‍යාව 96 කි.

| | | |
|---|---|---|
| 1. | විශ්ව විද්‍යාල | 17 |
| 2. | පාසල්, පළාත් සහ කලාප කාර්යාල | 68 |
| 3. | තාක්ෂණික විද්‍යාල | 17 |
| **මුළු සංඛ්‍යාව** | | **96** |





**111. දැනුවත් කිරීමේ වැඩමුළු**

නව නිපැයුම්, නවෝත්පාදන සහ බුද්ධිමය දේපළ ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු 08ක් කොමිසමේ මෙහෙයවීමෙන් පහත පාසල් කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදී.

1. මයුරපාද මහා විද්‍යාලය, මාවනැල්ල

2.දැඩිගම පැරකුම්බා මහා විද්‍යාලය, කෑගල්ල

3.සීවලී විද්‍යාලය, රත්නපුර

4.කෑගල්ලබාලිකා විද්‍යාලය, කෑගල්ල

5.උස්ගලතිස්ස මධ්‍ය මහා විද්‍යාලය, ගලිගමුව

6. ධහනෙක්ගෙදර මහා විද්‍යාලය, කුරුණෑගල

7. ධර්මාලෝක විද්‍යාලය, කැලණිය

8. හිල්වුඩ් විද්‍යාලය, මහනුවර

IV. පළාත් නව නිපැයුම් ප්‍රදර්ශන

කොමිසමට පැවරී ඇති එක් ප්‍රධාන කාර්යයක් වනුයේ පාසල් නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රවර්ධනය කිරීමයි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2 AB, 1C සහ 2 වර්ගයට අයත් රජයේ පාසල්හි, පාසල් මට්ටමේ නව නිපැයුම්සමාජ පිහිටුවීම සඳහා උපදෙස් ලබා දෙමින් නිකුත් කළ 2006.06.06 දිනැති චක්‍රලේඛය අනුව කටයුතු කරමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් දිවයිනේ පළාත් 09 ආවරණය වන පරිදි නව නිපැයුම් ප්‍රදර්ශන පවත්වනු ලබයි.

**පළාත් නවය ආවරණය වන පරිදි පැවැත් වූ ප්‍රදර්ශන පිළිබඳ විස්තර පහත දක්වා ඇත.**

| පළාත | ප්‍රදර්ශනය පැවැත් වූ ස්ථානය | දිනය | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| සබරගමුව | ඇහැලියගොඩ ජාතික පාසල | **2013.06.21** | **27** |
| නැගෙනහිර | මානව සම්පත් සංවර්ධන ආයතනය-තුල්සිරිපුර | **2013.07.05** | **27** |
| උතුර | කොකුවිල් හින්දු විද්‍යාලය, යාපනය | **2013.07.06** | **24** |
| මධ්‍යම | ඩී.එස්.සේනානායක විද්‍යාලය, මහනුවර | **2013.07.09** | **26** |
| දකුණ | මහින්ද රාජපක්ෂ විද්‍යාලය, මාතර | **2013.07.10** | **19** |
| උතුරු මැද | අධ්‍යාපන සංවර්ධන ආයතනය ,අනුරාධපුර | **2013.07.15** | **20** |
| වයඹ | ශ්‍රී නිශ්ශංක මහා විද්‍යාලය | **2013.07.20** | **23** |
| ඌව | හාලි ඇල ජාතික පාසල,බදුල්ල | **2013.08.02** | **27** |
| බස්නාහිර | ආනන්ද විද්‍යාලය, මරදාන | **2013.09.21** | **56** |

## වැඩසටහන 02 - Young Inventors Club - විද්‍යුත් මාධ්‍ය වැඩසටහන.

ශ්‍රී ලාංකේය තරුණ නව නිපැයුම්කරුවන් ඉලක්ක කර ගනිමින් විකාශය වූ ප්‍රථම රියැලිටි වැඩසටහන මෙයයි. මෙම වැඩසටහන සඳහා දිවයින පුරා ව්‍යාප්ත වූ ක්‍රියාකාරී පාසල් නවනිපැයුම් සමාජ 59ක් ඉලක්ක කර ගනිමින් නිර්මාණය වූ මෙම වැඩසටහන ස්වාධීන රූපවාහිනිය ඔස්සේ සතිපතා විකාශය කරන ලදී.

ලබා දෙන ගැටළුවකට සීමිත කාලයක් තුල තාක්ෂණික විසඳුමක්මක් සෙවීම පාසල් කණ්ඩායම් දෙකක් වෙත පැවරෙන අතර, එම නිර්මාණාත්මක විසඳුම් විද්වත් විනිසුරු මඩුල්ලකගේ ඇගයීමට ලක් වේ.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික පරමාර්ථය වන්නේ විද්‍යුත් මාධ්‍ය හරහා තරුණ නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණශීලී හැකියාවන් ජනතාව අතර ප්‍රචලිත කිරීම හා ඒ තුලින් ප්‍රේක්ශකයන් නව නිපැයුම්කරණය වෙත සමීප කරවීමයි.මෙම වැඩසටහනට ඉදිරිපත් වීම ශිෂ්‍යයන්ගේ පෞරුෂ සංවර්ධනයට ද බෙහෙවින් ඉවහල් වන බව පැහැදිලි කරුණකි.

විවිධ පාසල්වල නව නිපැයුම් සමාජ අතුරින් තෝරාගනු ලබන කණ්ඩායම් මෙම තරඟයට සහභාගීවීමට අවස්ථාව හිමිවේ.

විවිධ පාසල්වල නව නිපැයුම් සමාජ කණ්ඩායම් දෙකක් එකම වේලාවකදී තරඟ වදිනු ලබන අතර එහිදී වැඩිම ලකුණු ලබාගෙන ජයග්‍රහණය කරන කණ්ඩායම තරඟයේ දෙවන වටය සඳහා තෝරාලනු ලබයි.මේ අනුව මාස 06කට පසුව තෝරාගනු ලැබූ කණ්ඩායම් 06ක් දෙවන වටයට මුහුණ දෙන අතර එහිදී කණ්ඩායම් 03ක් තෝරාගනු ලබයි.මෙම කණ්ඩායම් 03 අතරින් වැඩිම ලකුණු ලබාගත් කණ්ඩායම් 02ක අවසන් වටයට සුදුසුකම් ලබයි.

පළමු වටය කොටස් 28 කින් ද, දෙවන වටය කොටස් 03කින්ද,අවසන් වටය එක් කොටසකින්ද සමන්විත වේ. පළමු, දෙවන හා තෙවන වටයන්හිදී ජයග්‍රහණය පාසැල් පහත පරිදී වේ.

**පළමු වටයේ ජයග්‍රාහක පාසල්**

1. ඉසිපතන විද්‍යාලය, කොළඹ
2. බණ්ඩාරනායක විද්‍යාලය, ගම්පහ
3. මාවනැල්ල මයුරපාද මධ්‍ය විද්‍යාලය
4. දැඩිගම පැරකුම්බා මධ්‍ය විද්‍යාලය, කෑගල්ල
5. ශ්‍රී කෝනේශ්වරම් හින්දු විද්‍යාලය, ත්‍රිකුණාමලය
6. මීපාවෙල අමරසූරිය විද්‍යාලය, ගාල්ල

මෙම පාසැල් කණ්ඩායම් සඳහා සහතික පත්‍ර හා සම්මාන පිරිනමන ලදී.

ඉහත පාසැල් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබාගත් පාසැල් හතර දෙවන වටයට නිර්දේශ විය.

1. මාවනැල්ල මයුරපාද මධ්‍ය විද්‍යාලය
2. දැඩිගම පැරකුම්බා මධ්‍ය විද්‍යාලය, කෑගල්ල
3. ශ්‍රී කෝනේශ්වරම් හින්දු විද්‍යාලය, ත්‍රිකුණාමලය
4. බණ්ඩාරනායක විද්‍යාලය, ගම්පහ

ඉහත කණ්ඩායම් හතරට තාක්ෂණික විසඳුම් සෙවීම සඳහා සමාන අභියෝග අවස්ථා 04 ක් ලබාගනී. ප්‍රායෝගිකත්වය හා නිරවද්‍යතාවයේ නිපුණත්වය මත මාවනැල්ල මයූරපාද මධ්‍ය විද්‍යාලයජයග්‍රාහී කුසලානයට හිමිකම් කී අතර, ත්‍රිකුණාමලයේ ශ්‍රී කෝනේශ්වර හින්දු විද්‍යාලය, තරඟයේ අනුශූරතාව හිමිකරගන්නා ලදී**.**

තරඟයේ ජනප්‍රියතම කණ්ඩායමට හිමි සම්මානය ස්වාධීන රූපවාහිණී ආයතනයේ අනුග්‍රහයෙන් ස්වාධීන රූපවාහිණී ආයතනය විසින් පිරිනමන ලද අතර එය **දැඩිගම පැරකුම්බා මධ්‍ය විද්‍යාලය** සතු විය.

තරඟයේ අවසන් වැඩසටහන ගරු තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් නිමාවට පත් විය.

වැඩසටහන සම්පාදනයේ දී හා විකාශනය කිරීමේදී පැන නැගුණු මූල්‍යමය ගැටළු වලට පිළියම් වශයෙන් සම්පත් බැංකුවේ අනුග්‍රහය ලැබුණු අතර සම්පත් බැංකුව සිසුන් වෙනුවෙන් සංවිධානය කළ කුසලතා සංවර්ධන වැඩමුළු ඔවුන්ට තරඟයට පහසුවෙන් මුහුණ දීම සඳහා මෙන්ම අනාගත ජීවිතය සඳහා ද මහෝපකාරී විය. ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන නව නිපැයුම්කරුවන් වෙනුවෙන් සම්පත් බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලදී.










## ප්‍රධාන ක්‍රමෝපායන් - පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට අන්තර්ගත කිරීම හරහා නිපැයුම් හා නව නිපැයුම්කරුවන් පිළිබඳව ඇති ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම හා බලගැන්වීම

### වැඩසටහන 03 - නව නිපැයුම්කරුවන්ගේ සමුළුව

වාර්ෂික නව නිපැයුම්කරුවන්ගේ සමුළුව ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහයෝගය ඇතිව පවත්වන ලද අතර ඒ සඳහා මෙවර නිර්මාණකරුවන් 59 දෙනෙකු සහභාගී විය. මෙම සමුළුවේ සම්පත් ආයතනයන් වශයෙන් සම්බන්ධ වූ සාර්ථක ව්‍යවසායකයන් වන රයිගම් සමූහ ව්‍යාපාරයේ ප්‍රධානී ආචාර්ය රවී ලියනගේ හා ලකී ලංකා සමාගමේ ප්‍රධානී ලාල් කීර්ති ගුණවර්ධන යන මහත්වරුන් සිය අත්දැකීම් සහ මඟපෙන්වීම් ඔස්සේ දේශන ඉදිරිපත් කළ අතර මෙම වැඩසටහන නව නිපැයුම්කරුවන්ගේ මහත් ඇගයීමට ලක් විය.

මෙම නව නිපැයුම් පිළිබඳව වූ සමුළුව නව නිපැයුම්කරුවන් 59කගෙන් සමන්විතව පැවැත්වුණි. රයිගම් කින්ඩම් ආයතනයේ ප්‍රධානී, රයිගම් නිෂ්පාදන හි නිෂ්පාදන හා අලෙවි කළමනාකරු ආචාර්ය රවී ලියනගේ මහතා සහ ලකී ලංකා ආයතනයේ ප්‍රධානීතුමා, ලාල් කීර්ති ගුණවර්ධන ඇතුළු පිරිස තම අත්දැකීම් නව නිපැයුම්කරුවන් සමඟ බෙදාගනු ලැබීය.

නව නිපැයුම්කරුවන් මෙම අවස්ථාව ඉතා ඇගයීමට ලක්කළ අතර තවත් බොහෝ දෙනෙකුට මෙවැනි අවස්ථාවක් ලබාදිය යුතු බව ඔවුන් ප්‍රකාශකර සිටින ලදී.

### වැඩසටහන 04 - ජිනීවා ජාත්‍යන්තර නව නිපැයුම් තරඟයට සහභාගී වීම

2012 වසරේ සහසක් නිපැයුම් ප්‍රදර්ශනයේදී විවෘත අංශයේ දසිස් සම්මානය දිනාගත් මංජු ගුණවර්ධන මහතා ට කොමිසම මගින් ජාත්‍යන්තර නව නිපැයුම් සඳහා වූ ප්‍රදර්ශනය ට සහභාගීවීම සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වන ලදී.

ප්‍රදර්ශනය ට ඉදිරිපත් කරනු ලැබූ ඔහුගේ ජයග්‍රාහී නව නිපැයුම් පහත දැක්වේ.

1. වායු පිරිසිදු කරන නැනෝ විදුලි බුබුළ
2. රෝහල් වල අසාදන තත්ත්ව පාලනය කිරීම සඳහා ඕසෝන්- ප්‍රකාශ උත්ප්‍රේරක පදනම් කරගත් සංයුක්ත පාරිසරික විෂබීජහරණ පද්ධතිය

ජිනීවා අන්තර්ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනයේදී එම නව නිපැයුම් දෙක පිළිවෙලින් රන් හා රිදී පදක්කම් දිනා ගන්නා ලදී.

**නැවත ලංකාවට පැමිණි පසු අරලියගහ මැදුරේදී ඔහු ගරු ජනාධිපතිතුමන් සහ ගරු අමාත්‍යතුමන් ඇතුළු පිරිසගේ ඇගයීමට ලක්විය.**

### වැඩසටහන 05 - "සහසක් නිමැවුම්" ජාතික නව නිර්මාණ ප්‍රදර්ශනය

දේශීය නිර්මාණකරුවන් ඇගයීම උදෙසා ක්‍රියාත්මක වන එකම ජාතික තලයේ ප්‍රදර්ශනය ලෙස හැඳින්විය හැකි නව නිපැයුම් කරුවන් හට එකම වේදිකාව වන මෙය නිර්මාණශීලී හැකියාවන් මතු කර දැක්වීමටත්, සම්මානයන්ගෙන් පිදුම් ලැබීමට හා ආයෝජකයන් සමඟ සම්බන්ධ වීමටත් ලබා දී ඇති සුවිශේෂී අවස්ථාවක් ලෙස "සහසක් නිමැවුම්" අර්ථ දැක්විය හැක. පාරම්පරික හා නූතන යන දෙයාකාරයෙන්ම තාක්ෂණික ක්ෂේත්‍රය ආවරණය කරමින් පාසල්, විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල, තෘතියික අධ්‍යාපන ආයතන හා විවෘත යන අංශයන් මෙන්ම වානිජකරණය වූ නව නිපැයුම් අංශය ද නියෝජනය කරමින් විවිධ වූ නිර්මාණ රාශියක් එකම ප්‍රදර්ශනයක දී දැක ගැනීමට අවස්ථාවද විශේෂත්වයකි.

"සහසක් නිමැවුම්" ජාතික නව නිර්මාණ ප්‍රදර්ශනය පහත දැක්වෙන ප්‍රධාන අංශයන් 04ක් යටතේ ක්‍රියාත්මක වේ. මෙම එක් එක් අංශයන්හි හොඳම නව නිපැයුම් සඳහා "දසිස් සම්මාන" පිරිනමන ලදී.
එම ප්‍රධාන අංශ යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර 12 ඇතුලත් වන අතර, එම එක් එක් තාක්ෂණික ක්ෂේත්‍ර නිර්මාණයන් ද පළමු, දෙවන හා තෙවන ස්ථාන වශයෙන් ඇගයීමට ලක් විය.

- පාසල් අංශය 249
- විශ්ව විද්‍යාල සහ කාර්මික විද්‍යාලඅංශය 208
- විවෘත අංශය 370
- වාණිජකරණ අංශය 12

මෙහිදී පාසල් අංශය නියෝජනය කරනු ලබන තරඟකරුවන්ගෙන් ජයග්‍රාහකයන් තිදෙනෙක් සඳහා කනිෂ්ට දසිස් සම්මාන 03ක් පිරිනමනු ලබයි.

තරඟය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි තාක්ෂණික ක්ෂේත්‍ර 12 කි. ඒවා පහත දක්වා ඇත.

| | |
|---|---|
| 1 කාණ්ඩය | - ආබාධිත පුද්ගලයන් ස්වාධීන පුද්ගලයන් බවට පත්කිරීම |
| 2 කාණ්ඩය | - පරිසරය |
| 3 කාණ්ඩය | - ආහාර |
| 4 කාණ්ඩය | - කෘෂිකර්මය |
| 5 කාණ්ඩය | - සෞඛ්‍ය හා පෝෂණය |
| 6 කාණ්ඩය | - බලශක්තිය |
| 7 කාණ්ඩය | - ඉදකිරීම් |
| 8 කාණ්ඩය | - ඉගැන්වීම් ආධාරක |
| 9 කාණ්ඩය | - ආරක්ෂාව හා සුරක්ෂිතභාවය |
| 10 කාණ්ඩය | - ඇඟළුම්, රෙදිපිළි හා උපාංග |
| 11 කාණ්ඩය | - සන්නිවේදනය හා ප්‍රවාහනය |
| 12 කාණ්ඩය | - විනෝදය |

ඉහත ජයග්‍රාහී අවස්ථාවන්ට අමතරව පහත දක්වා ඇති ජාතික වැදගත්කමකින් යුතු ක්ෂේත්‍ර 5ක් සඳහා විශේෂ සම්මාන පිරිනමනු ලැබේ.

1. සාම්ප්‍රදායික දැනුම
2. ආදේශ වැදගත්කම
3. ඉලෙක්ට්‍රොනික් විද්‍යාව
4. නැනෝ තාක්ෂණය
5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

මෙවර ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අංශ හතර යටතේ පහත පරිදි නව නිපැයුම් ලියාපදිංචි කරන ලදී.

- පාසල් අංශය 249
- විශ්ව විද්‍යාල සහ කාර්මික විද්‍යාලඅංශය 208
- විවෘත අංශය 370
- වාණිජකරණ අංශය 12

ගරු අමාත්‍යතුමන් අතින් ප්‍රදර්ශනය විවෘත කිරීමට මොහොතකට පෙර එක් ප්‍රදර්ශන කුටියක හටගත් ගින්න හේතුවෙන් නව නිපැයුම් 200 කට ආසන්න සංඛ්‍යාවක් විනාශයට පත් විය. මෙම තත්වය මත විවෘත, විශ්ව විද්‍යාල හා කාර්මික විද්‍යාල, වාණිජකරණය කරන ලද නව නිපැයුම් යන අංශයන් සඳහා ප්‍රදර්ශනය අවලංගු කරන ලද අතර පාසල් අංශයේ තරඟය පමණක් නියමිත තෙදින පුරා පැවැත්වීමට කොමිසම කටයුතු කරන ලදී.

| පළාත | සම්මාන ලද සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | **2** |
| බස්නාහිර | **22** |
| සබරගමුව | **10** |
| උතුරු මැද | **4** |
| වයඹ | **5** |
| දකුණ | **5** |
| ඌව | **5** |
| නැගෙනහිර | **7** |
| උතුර | **7** |

ඉතා ඉක්මනින් ගින්නෙන් විනාශ වූ සියළුම නව නිර්මාණ පිළිබඳ තොරතුරු වාර්තාගත කරන ලදී. පොලිස් පරීක්ෂණ හරහා ගින්නට හේතු වූ සැක කටයුතු ක්‍රියාවක් සිදුව ඇත්දැයි පරීක්ෂණ පැවැත් වූ නමුත් මෙහිදී අනාවරණය වූයේ ප්‍රදර්ශන කුටිය තුළ නව නිපැයුමක් ක්‍රියාකරවීමට යාමේදී ඇතිවූ දෝෂයක් හේතුවෙන් මෙම ගින්න හටගත් බවයි.

මෙම අවස්ථාවේ දී නිර්මාණකරුවන් ධෛර්යමත් කරමින් ඔවුන්ට අවැසි ශක්තිය ලබා දීමට ගරු අමාත්‍යතුමන් පෞද්ගලිකව ම කටයුතු කරන ලදී.

ප්‍රදර්ශනය ආරම්භයේ සැලසුම් කරන ලද පරිදී දෙවන හා තෙවන දිනයන් පිළිවෙලින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ හා ගරු තරුණ කටයුතු අමාත්‍යතුමන්ගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලදී.







## ෆීනික්ස් ව්‍යාපෘතිය






ගින්නෙන් සිදුවූ විනාශය හේතුවෙන් කොමිසම විසින් සිදුකරන ලද ඇගයීමේ ක්‍රියාවලිය හරහා සංවර්ධනය කළ යුතු අංශයන් හඳුනාගන්නා ලදී.

මෙලෙස පීඩාවට පත් නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීම වෙනුවෙන් රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ද සහයෝගය ඇතිව "ෆීනික්ස්" නමින් ව්‍යාපෘතියක් දියත් කරන ලදී. ගරු අමාත්‍යතුමන්ගේ මැදිහත් වීමෙන් මෙම නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලබා දිය හැකි සහයෝගය පිළිබඳව සොයා බලන ලද අතර පෞද්ගලිකවම මැදිහත් වී මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සහයෝගය ලබා ගැනීමට කටයුතු කළ අතර, එමගින් විවිධ පාර්ශවයන්ගේ උපකාර නිර්මාණකරුවන් වෙත ලබාගැනීම අපේක්ෂාව විය.

ප්‍රවීන විනිසුරු මඬුල්ලකගේ සහභාගීත්වයෙන් ගින්නෙහි බලපෑමට ලක් වූ නව නිර්මාණ වල ඇගයීම් සිදු කෙරුනු අතර, එහිදී හඳුනාගත් වාණිජකරණය ට නැඹුරුවක් ඇති නිර්මාණ සියල්ල විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත යොමු කරන ලදී. මෙම ඇගයීම් මගින් තෝරා ගන්නා ලද විශ්ව විද්‍යාල අංශයේ විශිෂ්ඨ නව නිර්මාණ ජිනීවා ජාත්‍යන්තර ප්‍රදර්ශනය වෙත යොමු කිරීමට පියවර ගැනුණි.

විශ්ව විද්‍යාල අංශයේ විශිෂ්ඨ නිර්මාණ , ජිනීවා ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය සඳහා නම් කිරීම අරමුණු කරගනිමින් ලයිස්තුගත කරන ලදී.

## වැඩසටහන 06 - ජනාධිපති සම්මාන

නව නිර්මාණ දිරිගැන්වීමේ පනත අනුව ක්‍රියාත්මක වෙමින් සෑම වසරකදී ම පේටන්ට් බලපත්‍රලාභී නව නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමට කොමිසම කටයුතු කරයි. ඒ අනුව 2011 හා 2012 වර්ෂයන් හි සම්මාන පිරිනැමීම මෙම වසරේ දී සිදු කෙරිණි. පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ප්‍රතිශතය අවම වීම හේතුවෙන් සම්මාන ප්‍රදානය වසර 2කට වරක් සිදු කරනු ලබයි.

- ❖ 2011 වසරේදී ජනාධිපති සම්මාන සඳහා ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව 23
- ❖ 2012 වසරේදී ජනාධිපති සම්මාන සඳහා ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව 29

- ➢ 2011 වසරේදී ජනාධිපති සම්මානලාභී ජයග්‍රාහකයින් සංඛ්‍යාව 08
- ➢ 2012 වසරේදී ජනාධිපති සම්මානලාභී ජයග්‍රාහකයින් සංඛ්‍යාව 06

## 2011 වසරේදී ජනාධිපති සම්මානලාභී ජයග්‍රාහකයින්

| නව නිපැයුමේ නම | නව නිපැයුම්කරුගේ නම | ලිපිනය | කාණ්ඩය | ලබාගත් සම්මානය |
|---|---|---|---|---|
| | මහාචාර්ය බෙනඩික් ෆ්රැන්සිස් ඇන්තනි බස්නායක | C/57,විශ්ව විද්‍යාල නිල නිවාස ඔගස්ටර්හිල් පේරාදෙනිය | පරිසරය | රන් සම්මාන |
| ස්වයංක්‍රීය වෝල්ටීයතා ආරක්ෂණ පද්ධතිය | කාර්මික තාක්ෂණ ආයතනය | | ඉංජිනේරු | රන් සම්මාන |
| ත්‍රිමාණ රූප තාක්ෂණය | අමන්දා නිර්මාණ | අංක.102/23, ඩොනල්ඩ් පෙරේරා මාවත, කොහිල වත්තමාවත,වැල්ලම්පිටිය | නිපුනතා | රන් සම්මාන |
| අඩු සුවඳැති සුදු ස්ප්‍රීතු නිෂ්පාදකය | කේ.ජ්.ඩී.ජ්.එල්.පෙරේරා | අංක.25/4A ජයපුර මාවත, බැද්දගාන පිටකෝට්ටේ | රසායන විද්‍යා | කුසලතා සම්මාන |
| | පැල්පොළ ලොකු ලියනගේ චමින්ද සුභාෂණ අල්විස් | අංක 294F ,සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ | බලශක්ති | කුසලතා සම්මාන |
| "link"ඩිජිටල් ටැක්සි මීටරය | ටී.පී කාරියකරවන ආචාර්ය අරුණ රත්නසූරිය | 27,තිඹිරිගස්යාය, කොළඹ 05/අංක 55/7ස්වර්ණ මාවත කොළඹ 06 | ප්‍රවාහන | කුසලතා සම්මාන |
| දෘෂ්ඨි කම්පන ඍජු ද්වාරය | ප්‍රසාද් තුෂාර පීරිස් | අංක 700/4A,හරිත උයන ,කොට්ටාව | කාර්මික තාක්ෂණ | කුසලතා සම්මාන |
| "Sunbird" තාක්ෂණය | ජූඩ් ප්‍රනාන්දුපුල්ලේ පෞද්ගලික සමාගම | | බලශක්ති | කුසලතා සම්මාන |

## 2012 වසරේදී ජනාධිපති සම්මානලාභී ජයග්‍රාහකයින්

| නව නිපැයුමේ නම | නව නිපැයුම්කරුගේ නම | ලිපිනය | කාණ්ඩය | ලබාගත් සම්මානය |
|---|---|---|---|---|
| සීලිං පංකා සඳහා ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික කාල හා වේග පාලකය | මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්.පෙරේරා | නො.86 පාසැල් මාවත කොළඹ 03 | ඉංජිනේරු | රන් සම්මාන |
| පොල්ලෙලි මඟින් ආරක්ෂිතව පොල් කෙඳි වෙන් කරගත හැකි යන්ත්‍රණය | අනුර සූරියාරච්චි | නො.66 ලබුගම හල්තොට | කාර්මික තාක්ෂණ | රන් සම්මාන |
| කරපිංචා මිශ්‍ර ක්ෂණික හාල්පිටි ඉදිආප්ප මිශ්‍රණය | ඒ.පී.ජයතිලක | යෝර්ක් ව්‍යාපාරය පරාක්‍රම සමුද්‍රය පොළොන්නරුව | ආහාර | රන් සම්මාන |
| ගෙල සහ කොඳු ඇට පෙළ අපහසුතා මඟහරවන“Sense Tech ” උපකරණය | අමිත් ද සිල්වා | නො.72 වැලිඅමුණ පාර හැඳල වත්තල | වෛද්‍ය | රන් සම්මාන |
| ජංගම දුරකථන සඳහා ස්වයංක්‍රීය “රීලෝඩ්” ක්‍රමය | දිසානායකගේ අජන්ත රොෂාන් දිසානායක | නො.154 පස්සර පාර පෙල්ගහ තැන්න | ඉංජිනේරු | රන් සම්මාන |
| ද්විත්ව චුම්භක ප්‍රේරණ සහිත පරිසර හිතකාමී කම්පන වාරිකය | සුබද්‍ර කංකානම්ලාගේ චන්ද්‍රලාල් කුමාරසිරි | නො.140 /D සමඟි මාවත කඳුබොඩ දෙල්ගොඩ | ප්‍රවාහන | කුසලතා සම්මාන |

## වැඩසටහන 07 - නව නිපැයුම්කරුවන් සඳහා වු ජාතික සම්මන්ත්‍රණය

අත්දැකීම්, දැනුම, අදහස් හුවමාරු කරගැනීම හා බෙදාහැරීම අරමුණු කරගනිමින් සංවිධානය කරන ලද මෙම හමුව ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අනුග්‍රහයෙන් සංවිධානය කරන ලද අතර, තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යතුමන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙහිදී වාණිජකරණ විභවයක් සහිත නව නිර්මාණ කිහිපයක් ප්‍රදර්ශනය කෙරුණු අතර ඒවා වෙළඳපොළ හඳුන්වාදීමට ඇති හැකියාව පිළිබඳව ද සාකච්ඡාව ට ගැනුණි.

එමෙන්ම විවෘත සාකච්ජා හා සංවාදාත්මක ස්වරූපයෙන් පැවති මෙම හමුවේ දී ගරු අමාත්‍යතුමන් සමඟ සෘජු කතාබහක නියැලීම ට නව නිපැයුම්කරුවන්ට අවකාශය සැලසුණි.

තව ද නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙන් මූල්‍යාධාර ලබාගැනීමට සුදුසුකම් ලැබූවන් සඳහා ඔවුන්ගේ පළමු ණය වාරිකය ගරු අමාත්‍යතුමන් අතින් ලබා දීමට ද කටයුතු කරන ලදී.











## 6. ප්‍රධාන ක්‍රමෝපායන් - ප්‍රධාන තාක්ෂණ වෙළඳපොළට ප්‍රවිෂ්ට වීම

### වැඩසටහන 08 - ව්‍යාපාරික හමුව

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය හා ලංකා තරුණ ව්‍යවසායකයන්ගේ සංගමයේ සහභාගීත්වය ඇතිව මෙම ව්‍යාපාරික හමුව පවත්වන ලදී. මෙය පෞද්ගලික ව්‍යාපාර අංශයත් සමඟ සමීපව කටයුතු කිරීම සඳහා කොමිසම වෙත ලැබුණු සුවිශේෂී අවස්ථාවක් විය.

### වැඩසටහන 09 - වෙබ් අඩවිය

කොමිසමේ සමස්ථ ක්‍රියාකාරීත්වය තුළ  වෙබ් අඩවියේ කාර්යභාරය ඉතා පුළුල් වන අතර, දේශීය නව නිපැයුම්කරුවන් වෙත ජාත්‍යන්තර සහයෝගය ලබාදීමට අමතරව කොමිසමේ සියලුම ව්‍යාපෘතීන් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඇතුළත් ප්‍රභල මාධ්‍යයක් ලෙස ද කටයුතු කරයි.

මේ වන විට 500 - 600 දක්වා වූ විශිෂ්ට පිවිසුම් ප්‍රතිශතයක් පෙන්නුම් කරන අතර, බොහොමයක් නව නිපැයුම්කරුවන් සඳහා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විසඳුම් අපේක්ෂාවෙන් ඉල්ලීම් හා ගැටළු ඉදිරිපත් ව තිබීම ද වෙබ් අඩවියේ සුවිශේෂීත්වය පෙන්නුම් කරන්නකි.

## වැඩසටහන 10 - නව නිපැයුම්කරුවන්ගේ අරමුදල

නව නිපැයුම්කරුවන් සඳහා වන අරමුදල 2009 වසර තෙක් අකර්මණ්‍ය ව පැවතුන මුත් 2013 වසරේදී නව නිපැයුම්කරුවන් 08 දෙනෙක් සඳහා ආධාර මුදල් ලබාදීම තුළින් නැවත ක්‍රියාකාරී තත්වයට පත්කරන ලදී.

මෙම මූල්‍යාධාර ලබා දීමේ ක්‍රියාවලිය පුළුල් පාරදෘශ්‍ය ස්වරූපයෙන් ක්රියාත්මක කරන ලද අතර, 2012 වසරේ සහසක් නිමැවුම් ප්‍රදර්ශනයට සම්බන්ධ වූ නව නිපැයුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගන්නා ලදී. මේ සඳහා ප්‍රවීන විනිසුරු මඩුල්ලක ගේ දායකත්වය හිමිවූ අතර, අදියර කිහිපයක් යටතේ පැවති අධීක්ෂණයන් තුළින් අයදුම්කරුවන් 40 දෙනෙකු අතරින් වාණිජමය නැඹුරුවක් ඇති නව නිපැයුම් 8 කට අවස්ථාව හිමි විය. මොවුන් වෙත රු.100,000/= ක අවමයේ සිට විහිදුනු පරාසයක් දක්වා මූල්‍යාධාර ප්‍රදානය කළ අතර, අදියරෙන් අදියර ප්‍රගතිය පිළිබඳ ව කොමිසමේ නිලධාරීන් ස්ථානීය අධීක්ෂණයක නිරත වුනි.







| නව නිපැයුම්කරුගේ නම | නව නිපැයුමේ නම | ව්‍යාපෘතිය මගින් අනුමත මුදල | පළමු අදියරේ ගෙවන මුදල | අරමුදල ලබාදීමේ අරමුණ | දෙවන අදියරේ ගෙවන මුදල |
|---|---|---|---|---|---|
| එල්.ආර්.යූ.එච්.විජේරත්න | ඉරටු ශුද්ධකරණය | 25,000 | 25,000 | උපකරණය වැඩිදියුණු කිරීම | - |
| ආසිරි දිල්හාන් ද සිල්වා | පරිසර හිතකාමී හරිත බලශක්ති වලින් ක්‍රියාකරන කඩදාසි සෙල්ලම් බඩු | 200,000 | 200,000 | අමුද්‍රව්‍ය මිලදී ගැනීම | - |
| ආරියපාල උක්වත්ත | ළෑණු කපන යන්ත්‍රය | 50,000 | 50,000 | උපකරණ පහක් නිර්මාණය කිරීම සඳහා | - |
| හේමන්ත දිසානායක | මිනිස් අවයව වල ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන ආකෘතියක් | 100,000 | 100,000 | අමුද්‍රව්‍ය මිලදී ගැනීම | - |
| නෙළුම් උදයකාන්ත | රට කජු ශුද්ධ කරන යන්ත්‍රය | 50,000 | 50,000 | උපකරණය වැඩිදියුණු කිරීම | - |
| කේ.වී.ඒ.විජේවංශ | කාබනික වල්නාශකය | 250,000 | 240,000 | තෙල් පෙරන යන්ත්‍රයක් මිලදී ගැනීම | - |
| අමිත ද සිල්වා | වැසිකිලි ආධාරකය | 1,273,659 | 639,429 | අමුද්‍රව්‍ය මිලදී ගැනීම | 760,571 |
| කේ.එම්.විජේපාල | කාබනික පොහොර | 1,200,000 | 737,200 | අමුද්‍රව්‍ය මිලදී ගැනීම | 462,800 |

## 7. ප්‍රධාන ක්‍රමෝපායන් - මානව සම්පත් සංවර්ධනය

නව නිපැයුම්කරුවන් සඳහා අරමුදල් ලබාදීම පහත පරිදී සිදුවිය

**මානව සම්පත් සංවර්ධනය**

| තනතුර | පුරවන ලද තනතුරු සංඛ්‍යාව |
|---|---|
| **පර්යේෂණ සහකාර** | 03 |
| **කළමනාකාර සහකාර** | 03 |
| **වැඩසටහන් නිලධාරී** | 01 |
| **කා.කා.ස** | 01 |
| **රියදුරු** | 01 |

අධ්‍යක්ෂ තනතුර සම්පූර්ණ කිරීම සඳහා දෙවරක් පුවත්පත් දැන්වීම් පලකළ ද නියමිත අධ්‍යාපන සුදුසුකම් සමඟ වැටුප් පරිමාණය නොගැලපීම මත එම වැයම අසාර්ථක විය. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් අනුරාධා ඉලේපෙරුම මහත්මිය මේ දක්වා කොමිසමේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමේ රාජකාරි සිදු කළ අතර, තනතුරේ පුරප්පාඩු සපුරාලීමට නොහැකිවීම නිසා අමාත්‍යාංශය විසින් ඇයගේ සේවා කාලය 2013 දෙසැම්බර් මස දක්වා දීර්ඝ කරන ලදී.

පහත දැක්වෙන පුහුණු වැඩසටහන් කාර්යමණ්ඩලයේ ගුණාත්මභාවය වර්ධනය කිරීම සඳහා පවත්වන ලදී. ඇතැම් පුහුණු වැඩසටහන් සඳහා පෞද්ගලික ආයතන විසින් අනුග්‍රහය ලබා දුනි.

| නිලධාරියාගේ නම | තනතුර | ලැබූ පුහුණුව |
|---|---|---|
| සියළුම කාර්යමණ්ඩලය | | |
| දීපිකා කහටපිටිය මහත්මිය | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති) | |
| ගයාන් කුමාර මහතා | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | |
| සෙව්වන්දි පතිරණ මෙනවිය<br>එම්.ආර්. එම්.අරුෂ් මහතා | කළමනාකාර සහකාර | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ හා අපහරණය |
| කේ.කේ.ඩී.එස්.වී.රණවීර | වැඩසටහන් නිලධාරී | ව්‍යාපෘති කළමනාකරණය |
| නිරෝෂා සිරිවර්ධන මහත්මිය<br>වෙරිකා සෙනෙවිවික්‍රම මහත්මිය | වැඩසටහන් නිලධාරී | පාලනය පිළිබඳ සංවර්ධන ක්‍රියාවලිය |
| කේ.කේ.ඩී.එස්.වී.රණවීර මහත්මිය<br>වෙරිකා සෙනෙවිවික්‍රම මහත්මිය<br>තාරකා වීරසේන | වැඩසටහන් නිලධාරී<br>පර්යේෂණ සහකාර | බුද්ධිමය දේපල හා පේටන්ට් අයිතිය |
| දේවිකා බස්නායක මහත්මිය<br>එම්.ආර්. එම්.අරුෂ් මහතා | කළමනාකාර සහකාර | 1.කාර්යාල කළමනාකරණය හා කාර්යාල කාර්යපටිපාටිය<br>2. කළමනාකරණය හා සංවර්ධනය පිළිබඳ කුසලතා වර්ධනය |

## 8. මාධ්‍ය ප්‍රචාරණය

නව නිපැයුම්කරණයේ අවශ්‍යතාවය හා කොමිසමේ කාර්යභාරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා මුද්‍රිත මාධ්‍ය භාවිතා කරන අතර, බොහෝ විට කතුවැකිය හරහා නිදහස් ඉඩකඩක් හිමිවීම විශේෂත්වයකි. ආයතනයක් වශයෙන් නව නිපැයුම් කොමිසමේ වටිනාකම හා වැදගත්කම හේතුවෙන් එහි ක්‍රියාකාරී වැඩසටහන් සඳහා මාධ්‍ය ප්‍රචාරණය නිතැතින්ම ලැබේ.

මීට අමතරව ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්තුමා විසින් ජාතික හා අන්තර්ජාතික සම්මන්ත්‍රණවලදී නව නිපැයුම් පිළිබඳව සඳහන් කිරීමට කටයුතු කරනු ලබයි. මේ හේතුවෙන් නව නිපැයුම් වැඩි දියුණු කිරීම හා ප්‍රචාරණය සඳහා පෞද්ගලික ආයතනයන්හි සහයෝගය නිතැතින්ම හිමි වේ.

- 'ඒෂියන් වෝල් ස්ට්‍රීට්' පුවත් පත් ආයතනය විසින් සිංගප්පූරුවේදී පවත්වන ලද "Unleashing Innovation 2013" වැඩසටහන සඳහා ප්‍රධාන ආරාධිත පුද්ගලයකු වශයෙන් කොමසාරිස්තුමා සහභාගී වීම.
- ශ්‍රී ලංකා පරිගණක සංගමයේ ජාතික සමුළුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ජාතික සමුළුව
- ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය(LBO) විසින් සංවිධානය කරන ලද නවෝත්පාදන ක්‍රමෝපායන් පිළිබඳ සමුළුව
- පශ්චාත් උපාධි ආයතනයෙහි පැවති නවෝත්පාදනයන් පිළිබඳ විශේෂ සැසිය
- සාමාජිකයන් සඳහා ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය තුළ පැවති සැසිවාරය
- කොළඹ රොටරි සමාජ දෙකෙහි සාමාජිකයන් අතර පැවති සාකච්ඡා

ඊට අමතරව කොමසාරිස්තුමා විසින් නවෝත්පාදනය පිළිබඳව දිරිමග, බිස්නස් lk වැනි සඟරා වල ලිපි පළ කිරීම හා ස්වාධීන රූපවාහිනී නාලිකාව තුළ විකාශනය වන දොරමඬලාව හා රූපියල් සත වැනි සඟරාමය වැඩසටහන් වෙනුවෙන් නවෝත්පාදන පිළිබඳ විශේෂ දේශනයන් පැවැත්වීම තුලින් මාධ්‍ය ප්‍රචාරණයත් නව නිපැයුම් සඳහා හිමි වී තිබේ.

## 10. නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට අදාල පනත

**1979 අංක 53 දරණ නව නිපැයුම් දිරිගැන්වීමේ** පනත, කොමිසමේ වත්මන් කාර්යභාරයන් ට අනුකූලව සංශෝධනය විය යුතු බව දක්වමින් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශ ලේකම් හරහා දැනුම් දීමක් ඉදිරිපත් කර ඇත.

## 11. අය වැය සහ අනෙකුත් යෝජනා

**මුද්‍රිත** මාධ්‍ය භාවිතා කරන අතර, බොහෝ විට කතුවැකිය හරහා නිදහස් ඉඩකඩක් හිමිවීම විශේෂත්වයකි.

## 12. විගණන වාර්තාව

# මූල්‍ය

# ප්‍රකාශන

# 2013 (නැවත සකස් කරන ලද)

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

# 2013 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 2013 ගලපන ලද | 2013 | 2012 ගලපන ලද |
|---|---|---|---|---|
| <u>වත්කම්</u> | | රු. | රු. | රු. |
| <u>ජංගම නොවන වත්කම්</u> | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 5 | **8,412,881.05** | 8,422,486.05 | 10,273,004.82 |
| ආපදා ණය | | **549,420.00** | | 482,930.00 |
| <u>ජංගම වත්කම්</u> | | | | |
| අනෙකුත් කොන්ත්‍රාත්තුමය සේවාවන් සඳහා පූර්ව ගෙවීම | | **341,088.44** | 341,088.44 | 341,088.44 |
| ආපදා ණය | | **158,780.00** | 708,200.00 | 164,160.00 |
| ණය නව නිපැයුම්කරුවන්ගේ අරමුදල | | **9,534,220.76** | 9,534,220.76 | 9,634,260.80 |
| (අඩු) අඩමාන ණයකරුවන් සඳහා ප්‍රතිපාදන (100%) | | **(9,534,220.76)** | | - |
| උත්සව අත්තිකාරම් | | **8,300.00** | 8,300.00 | 9,300.00 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | | | | |
| ක්‍රමසම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය | | **7,560.00** | 7,560.00 | 7,560.00 |
| ඉන්ධන තැන්පතු | | **100,000.00** | 100,000.00 | 100,000.00 |
| ඡන්ද කොමසාරිස් | | **13,524.50** | 13,524.50 | 13,524.50 |
| අනෙකුත් අත්තිකාරම් | 6 | **138,472.37** | 138,472.37 | 136,632.80 |
| මුදල් සහ බැංකු ශේෂ | 7 | **5,396,633.49** | 5,396,633.49 | 4,363,456.35 |
| **මුළු වත්කම්** | | **15,126,659.85** | 24,670,485.61 | 25,525,917.71 |
| <u>ස්කන්ධය සහ බැරකම්</u> | | | | |
| සමුච්චිත අරමුදල | 8 | **7,180,781.05** | 16,906,606.81 | 16,187,077.77 |
| අනෙකුත් අරමුදල් | 9 | **4,001,821.34** | 4,001,821.34 | 2,543,450.34 |
| <u>ජංගම නොවන බැරකම්</u> | | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 10 | **1,567,979.50** | 1,567,979.50 | 808,511.25 |
| <u>ජංගම බැරකම්</u> | | | | |
| උපචිත වියදම් | 11 | **2,376,077.96** | 2,194,077.96 | 5,986,878.35 |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | | **15,126,659.85** | 24,670,485.61 | 25,525,917.71 |

සකස් කළේ: ………………………………..

පරීක්ෂා කළේ: ……………………………….

අත්සන් කළේ:

........................................
ඩබ් එස් සී ජී කුමාර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
දිනය:

..........................................
ඩී සී ඒ සත්රුකල්සිංෂ
අධ්‍යක්ෂ
දිනය:

………………………….
දීපාල් සූරියආරච්චි
කොමසාරිස්
දිනය:

**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | සටහන් | 2013 ගලපන ලද රු. | 2013 රු. | 2012 ගලපන ලද රු. |
|---|---|---|---|---|
| ආදායම | | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | | **16,530,000.00** | 16,530,000.00 | 17,992,000.00 |
| **මුළු ආදායම** | | **16,530,000.00** | 16,530,000.00 | 17,992,000.00 |
| **අනෙකුත් ආදායම්** | 4 | **1,141,825.08** | 1,141,825.08 | 390,379.44 |
| **මුළු ආදායම්** | | **17,671,825.08** | 17,671,825.08 | 18,382,379.44 |
| **(1) පාලන සහ ආයතන** | | | | |
| කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් | 1 | **7,461,297.88** | 7,461,297.88 | 6,138,272.69 |
| පාලන සහ ආයතන වියදම් | 2 | **18,801,214.57** | 9,084,993.81 | 9,708,843.70 |
| ක්ෂයවීම - ස්ථාවර වත්කම් | 5 | **3,107,373.76** | 3,097,768.76 | 5,521,628.93 |
| පාරිතෝෂික | 10 | **884,388.25** | 884,388.25 | 152,536.37 |
| **(11) ව්‍යාපෘති වියදම්** | | | | |
| නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම් | 3 | **13,484,847.34** | 13,484,847.34 | 25,960,193.31 |
| **මුළු වියදම්** | | **43,739,121.80** | 34,013,296.04 | 47,481,475.00 |
| **වියදමට එරෙහිව ආදායම** | | **(26,067,296.72)** | (16,341,470.96) | (29,099,095.56) |
| **ආදායම සමුච්චිත අරමුදල වෙත මාරු කිරීම** | | **17,671,825.08** | 17,671,825.08 | 18,382,379.44 |

# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## ස්කන්ධය වෙන්ස්වීමේ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල රු. | අනෙකුත් අරමුදල් රු. | මුළු ස්කන්ධය රු. |
|---|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය (නැවත සඳහන් කරන ලද) | 10,087,396.53 | 2,543,450.34 | 12,630,846.87 |
| 2012 වසර සඳහා අතිරික්තය / (හිඟ) | (29,099,095.56) | - | (29,099,095.56) |
| රජයේ දායකත්වය - ප්‍රාග්ධන | 21,562,000.00 | - | 21,562,000.00 |
| විකිණීමෙන් උපයාගත් මුදල් (භාණ්ඩාගාරය වෙත පැවරීම) | (2,969,760.00) | | (2,969,760.00) |
| ප්‍රාග්ධන ලැබීම් | 4,247,537.00 | | 4,247,537.00 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | (19,000.00) | | (19,000.00) |
| රජයේ ප්‍රදාන (KI-0614 වාහනය) | 3,528,000.00 | | 3,528,000.00 |
| රජයේ ප්‍රදාන (PE-3144 වාහනය) | 8,850,000.00 | | 8,850,000.00 |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සඳහන් කරන ලද)** | **16,187,077.97** | **2,543,450.34** | **18,730,528.31** |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය (නැවත සඳහන් කරන ලද) | 16,187,077.97 | 2,543,450.34 | 18,730,528.31 |
| 2013 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | (26,067,296.72) | - | (26,067,296.72) |
| රජයේ දායකත්වය - ප්‍රාග්ධන | 17,061,000.00 | - | 17,061,000.00 |
| අමාත්‍යාංශයෙන් ලද දායකත්වය | - | 3,500,000.00 | 3,500,000.00 |
| නව නිපැයුම්කරුවන් සඳහා බෙදාදීම | | (2,041,629.00) | (2,041,629.00) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සඳහන් කරන ලද)** | **7,180,781.25** | **4,001,821.34** | **11,182,602.59** |

# 2013 දෙසැම්බර් 31 දිනට

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2013 ගලපන ලද | 2013 | 2012 ගලපන ලද |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ලත් මුදල් ප්‍රවාහය** | | රු. | රු. | රු. |
